# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
2024 ඔක්තෝබර් / නොවැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ සංස්කෘතිය (නව නිර්දේශය)

**භාරතීය සංස්කෘතික පසුබිම හා බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම BUCU – 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ප්‍රාග් වෛදික යුගයේ පැවතියේ යැයි සැලකිය හැකි ආගමික විශ්වාස තුළින් ප්‍රකට වන ආගමික චින්තාවේ විවිධත්වය විමර්ශනය කරන්න.

02. බහුදේවවාදයේ ස්වරූපය සැකෙවින් විමසා එය ඒකදේවවාදයක් දක්වා වර්ධනය වීමට බලපෑ හේතු පැහැදිලි කරන්න.

03. බ්‍රාහ්මණ සම්ප්‍රදායේ දැක්වෙන නිර්මාණවාදය, ආත්මවාදය හා කෙසේ සම්බන්ධ වන්නේ දැයි සාකච්ඡා කරන්න.

04. භක්ති මාර්ගයෙන් බැහැරව විචාර පූර්වක වූ ආගමික චින්තාවක ආරම්භය ආරණ්‍යක යුගය තුළ දක්නට ලැබෙන ආකාරය පෙන්වා දෙන්න.

05. ශ්‍රමණ සම්ප්‍රදායයේ සුවිශේෂ ලක්ෂණ හඳුන්වා, අකිරියවාදය පිළිබඳව ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

06. ජීවන ගැටලු විසඳීමෙහි ලා ත්‍රිලක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් කෙසේ ඉවහල් කොටගත හැකි දැයි විමර්ශනය කරන්න.

07. සාංසාරික ප්‍රවෘත්තිය පිළිබඳ යථාර්ථාවබෝධයට හා ජීවිතාවබෝධයට පටිච්චසමුප්පාද න්‍යාය උපයෝගී වන ආකාරය පැහැදිලි කරන්න.

08. ශ්‍රද්ධාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් නිර්මාණවාදී ආගම්වල එන භක්තිය පිළිබඳ සංකල්පයෙන් වෙනස්වන ආකාරය ආකාරවතී ශ්‍රද්ධාව ඇසුරෙන් පෙන්වා දෙන්න.

09. හොඳ නරක විනිශ්චයෙහි ලා ඉදිරිපත් වන බෞද්ධ ඉගැන්වීම් අදාළ සූත්‍ර දෙකක් අසුරෙන් සාකච්ඡා කරන්න.

10. බෞද්ධ ශීල ශික්ෂාවේ ප්‍රභේද සැකෙවින් සාකච්ඡා කොට, ශීලය බෞද්ධ නිර්වාණ මාර්ගයේ පදනම වන ආකාරය ප්‍රකට කරන්න.

**********************************